## මාතර මහා නගර සභාව

*1.* *මූල්‍ය ප්‍රකාශන*

*1.1* *මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම*

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 12 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 සැප්තැම්බර් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

*1.2* *මතය*

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතර මහා නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

*1.3* *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම*

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) නිවැරදි ආරම්භක ශේෂ නොමැති ගිණුම් විෂයයන් 06 ක් වර්ගීකරණයකින් තොරව රු.15,228,857 ක ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ජර්නල් සටහන් අංක 55 අනුව සමාලෝචිත වර්ෂයේ ගබඩා අත්තිකාරම් හා ගබඩා ණයගිම් ගිණුමෙන් මිලදී ගන්නා ලද රු.69,871 ක් වූ ස්ථාවර වත්කම් අගය සඳහා අදාල ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් අතර ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ගලි බවුසරය සඳහා වූ රු.23,622 ක ණය වාරික අදාල ණය ගිණුමට හර නොකොට මාර්ගස්ථ ණයවාරික ගිණුමකට ජර්නල් සටහන් අංක 48 මගින් හර කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල් වාරික ගෙවීම්, වියදමක් ලෙසට ගිණුම්ගතවී තිබියදී ජර්නල් සටහන් අංක 43 මගින් රු.84,261 ක වියදම අධිකතා ඌනතා ගිණුමට නැවත හර කිරීමෙන් වියදම ද්විගණනය වී තිබුණි.

(ඉ) ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1204 ශ්‍රී (SF) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ ඉදිකල මාතර බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු ණය වාරික හා පොලී රු.67,736,561 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල රු.49,774,022 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.17,962,539 ක් විය.

(ඊ) බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ණය ආපසු ගෙවීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන රුහුණු සංවර්ධන බැංකුවේ අංක 14600 ඉතිරි කිරීමේ ගිණුමේ පොලිය සහා ආදායමක් නොවුවද ජර්නල් සටහන් අංක 23 මගින් රු.94,499 ක් සමාලෝචිත වර්ෂයේ ලද පොලී ආදායම් ලෙසට ගිණුම් ගත කර තිබුණි.

(උ) බස්නැවතුම්පොල වෙළඳ සංකිර්ණය ඉදිකිරීම වෙනුවෙන් වූ ණය ගිවිසුමේ අංක 04 කොන්දේසිය පරිදි එකී ණය මුදල පියවීමට නියමිත ආදායම් ලැබීම් සහා ආදායමක් නොවුවද ජර්නල් සටහන් අංක 65 මගින් රු.4,626,325 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙසට ගිණුම්ගත කර තිබුණි.

(ඌ) බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන්වූ ණය ගිවිසුමේ අංක 9.03 කොන්දේසිය පරිදි හා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2001 අගෝස්තු 20 හා අංක 7/3/12/මාතර දරන ලිපිය පරිදි එකී ණය මුදල පියවීමට නියමිත ස්ථාවර තැන්පත් හා ඒ මත ලැබෙන පොලී ආදායම් වෙනත් කාර්යයක් සඳහා යොදා ගත නොහැකි වුවද ජර්නල් සටහන් අංක 66 මගින් රු.3,726,500 ක් ස්ථාවර තැන්පත් ගිණුම බැරකර අංක 15182 දරණ වෙනත් බැංකු ගිණුමකට හර කර ජර්නල් සටහන් අංක 67 මගින් එකී ගිණුමෙන් සභාවේ වෙනත් ණය ගිණුම් වල පොලී ගෙවීම සඳහා රු.3,777,516 ක් ඉවත්කර ගෙන තිබුණ.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.36,441,390 ක දායක මුදල් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

1.3.2 නිරවුල් නොකල ගිණුම්

නිරවුල් නොකළ රු. 9,028,102 ක ගිණුම් ශේෂ 04 ක් දිගුකාලයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 06 කට අදාලව වටිනාකම රු.97,107,392 ක් වූ අතර ඉදිරිපත් කර තිබූ උපලේඛණ අනුව වටිනාකම රු.85,685,778 ක් වූයෙන් වෙනස රු.11,421,614 ක් විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.183,059,443 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් 07 කට අයත් රු.191,075,851 ක් වටිනා ශේෂයන් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා, අයිතිය හා පැවැත්ම තහවුරු කෙරෙන ලිපිලේඛණ, උපලේඛණ, ශේෂ සහතික, පැහැදිලි කිරීම් ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 පිළිතුරු නොලත් විගණන විමසුම්

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 19 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.21,403,834 ක් විය. පිළිතුරු නොලත් විගණන විමසුම් වල කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

| *කාල සීමාව* | *විමසුම් ගණන* |
|---|---|
| මාස 03 ට අඩු | 02 |
| මාස 03 සිට අවුරුදු 01 දක්වා | 06 |
| අවුරුදු 01 සිට අවුරුදු 02 දක්වා | 07 |
| අවුරුදු 02 සිට අවුරුදු 03 දක්වා | 04 |
| | 19 |

*1.3.7 නීති, රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම*

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|
| *(අ)* | | *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි.* | |
| | (i) | මු.රෙ.371 හා මු.රෙ. 371(2) (ඇ) | ලබා ගන්නා ලද අත්තිකාරම් මුදල අදාල කාර්ය නිමවූ විගස පියවිය යුතු වුවත් 1999 සිට 2010 දක්වා අවස්ථා 28 කදී ගෙවන ලද රු.1,531,481 ක් වූ අත්තිකාරම් 2010 දෙසැම්බර් 31 දන වන විටත් පියවා නොතිබුණි. |
| | (iii) | මු.රෙ. 571 | හිමිකම් නොදැක්වූ රු.14,380,192 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි.2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතු පරිගණක 41 ක් හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ සභාපතිගේ 2003 දෙසැම්බර් | විශ්‍රාම වැටුප් රහිතව රාජ්‍ය සේවයේ නියුතු සේවකයින්ගෙන් දෛනික ගෙවීම් හෝ මාසික දීමනා වැටුපෙන් 8% ක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු වුවත් එකී විධිවිධානයට පටහැනිව ශ්‍රී ලංකා මහ |

02 දිනැති අංක 1/2003 චක්‍රලේඛය බැංකුව විසින් පවත්වා ගෙන යන සේවක අර්ථ සාධක අරමුදලට දායක වී 2010 වර්ෂය දක්වා ඒ සඳහා රු.2,737,294 දායක මුදල් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### *2.1 මූල්‍ය ප්‍රතිඵලය*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,818,001 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,198,762 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ආදායම්, තථ්‍ය ආදායම් ඇතුළු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 පෙබරවාරි 28 දිනැති මාගේ ලිපියට අනුව නියමිත අකෘතියක ඉදිරිපත් කරන ලෙස නාගරික කොමසාරිස්වරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබිණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010<br>රු.<br>'000 | 2009<br>රු.<br>'000 | % | % |
| වරිපනම් | 29.336 | 27.075 | 8.35 | - |
| වෙළඳ බලපත්‍ර | 2.702 | 2.496 | 8.25 | - |
| බදු කුලී | 40.918 | 38.242 | 6.99 | - |
| වෙනත් ආදායම් | 3.256 | 3.415 | - | 4.65 |

#### *2.2.2 හිඟ ආදායම් අයකර ගැනීම*

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 171 වගන්තිය අනුව සභාවට අයවිය යුතු සියළු ආදායම් අයකර ගැනීමේ බලතල නාගරික කොමසාරිස්වරයා සතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 76,212,434 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

#### *2.2.3 විනෝද බදු*

2006 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනඑමින් පවතින විවිධ ණයගැති ශේෂය තුල දැක්වෙන රු.4,599,518 ක් වූ පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබිය යුතු විනෝද බදු මුදල ප්‍රතිපූර්ණය කරවා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේද ඉදිරියට ගෙන තිබුණි.

#### 2.2.4 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ ගෘහ, වානිජ, පාරිභෝගිකයන් හා රජයේ ආයතන ඇතුලත් වරිපනම් පාරිභෝගිකයන් 21923 ක් වූ අතර පසුගිය වර්ෂ 05 ක බිල්කල මුදල, අයවූ මුදල, හා හිඟහිටි ප්‍රමාණය වාර්ෂිකව වැඩිවී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි මුදල රු.25,386,174 ක් විය.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) එක් එක් වර්ෂයේ බදු අයවීමේ ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි එක් එක් වර්ෂයේ බිල්කල මුදලින් සමාලෝචිත වර්ෂයේ අයවූ මුදල ගණනය කරගත හැකි ආකාරයේ පරිගණක ගත කල පැකේජයක් නොතිබුණි.

(ii) හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය පරිදි සමාලෝචිත වර්ෂයේද රු.21,371,657 ක් බදු එකතු කරන්නන් 09 දෙනෙකු වෙත පවරා තිබූ අතර කාර්තු 03 කදී අයවී තිබූ මුදල රු.3,545,339 ක් විය.අයකර ගැනීමේ ප්‍රගතිය 16% ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

(iii) මහා නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය පරිදි යම් වරිපනම් බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම වරිපනම් බද්ද අයවිය යුතු ස්ථානයේ අයිතිකරුගේ චංචල හෝ නිශ්චල සෑම දේපලක්ම ඒ ස්ථානය තුල හෝ ඒ මත ඇති කවර තැනැත්තෙකුට වුවද අයත් සියළු චංචල දේපලක්ම තහනම් කර විකිණීමෙන් එම

වරිපනම් බද්ද හා අයකර ගැනීමේ ගාස්තු අයකර ගැනීම කළයුතු වුවද 2006 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුල වූ රු.25,386,174 ක හිඟහිටි බදු සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

2.2.5 කඩ කාමර බදුදීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාතර බස්නැවතුම්පොළ කඩ කාමර

(i) මාතර බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1204 ශ්‍රී (SF) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ 1995 ජනවාරි 03 හා 1997 අගෝස්තු 28 දිනැතිව නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අත්සන් කල ගිවිසුම් යටතේ රු.108,204,397 ක් වැයකර පහල මාලයේ කඩ කාමර 11 ක්ද ඉහල මාලයේ කඩ කාමර 110 ක්ද ලෙසට කඩ කාමර 121 ක් ඉදිකර බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් හිඟහිටි බදු මුදල රු.3,882,250 ක් විය.

(ii) මෙම කඩ කාමර බදුදීම සඳහා 2000 මාර්තු 08 දින ටෙන්ඩර් කැඳවා තිබුණද ලැබුන ටෙන්ඩර් පත්‍රිකා, ටෙන්ඩර් ඇගයීම් වාර්තා, ටෙන්ඩර් මණ්ඩල තීරණ ඊට අදාල සභා තීරණ ඇතුලත් ලිපිගොනුවක් නොතිබුණි.

(iii) ටෙන්ඩර් පත්‍රිකාවේ 2.12 කොන්දේසිය පරිදි එක්වන් මුදලින් 50% ක් දින 14 ක් තුලදී හා ඉතිරිය දින 30 ඇතුලතද මාස තුනක කුලිය එකවරද ගෙවිය යුතු විය. ඒ අනුව අවම වශයෙන් රු.55,780,250 ක මුදලක් ලැබිය යුතුව තිබුණද 2000 අප්‍රේල් 14 සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.34,515,731 ක් පමණක් ලැබී තිබුණි.

(iv) මහා නගර සහා ආඥා පනතේ 185 (2)(ඇ) වගන්තිය පරිදි ලැබෙන බදුකුලී, 186 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබූ රුහුණු සංවර්ධන බැංකුවේ ඉතරකිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

(v) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 383 පරිදි බැංකුවට කෙලින්ම මුදල් බැරකරන විට බැංකුවට මුදල් බැඳීමේ වවුචරවල හිස් ආකෘතිපත්‍ර සපයා දියයුතුවාත් හැර මුදල් ගෙවන අය ලවා එම වවුචර සම්පූර්ණ කරවාගෙන නොතිබූ අතර මු.රෙ.395 පරිදි ගිණුමේ ගනුදෙනු පිළිබඳව මාසික ප්‍රකාශ පත්‍ර ඉදිරිපත් කර නොතිබුණෙන් සත්‍ය වශයෙන්ම ලද මුදල පිළිබඳව තහවුරු කරගත නොහැකි විය.

(vi) සභාව නඩත්තු කර තිබූ ලිපිගොනු අනුව එක්වන් මුදල් හා කඩ කාමර කුලී ලෙසට කඩකාමර 121 න් රු.34,515,731 ක් ලැබී ඇති බව දක්වා තිබුණද රුහුණු සංවර්ධන බැංකුවේ වාර්තා අනුව ලැබී තිබුණේ රු.32,790,831 ක් වූයෙන් වෙනස රු.1,724,900 ක් විය.

(vii) මෙම කඩ කාමර සම්බන්ධයෙන් 2011 අප්‍රේල් 29 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- ❖ ඉහල මාලයේ කඩ කාමර 39 ක් වසා දමා තිබූ අතර ඒවායින් 2010 දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුදල රු.1,657,858 ක් විය.

- ❖ ගිවිසුමේ කොන්දේසි අංක 5.2.5 ට පටහැනිව බදුකරුවන් 16 දෙනෙකු වෙළඳාම් කිරීමේ අයිතිය වෙනත් පුද්ගලයන් වෙත පවරාදී තිබූ අතර ඒ ඒ කඩහිමියන්ගෙන් සභාව අයකරන කුලියමෙන් දසගුණය, සිව්ගුණය වැනි අධික කුලී අයකරමින් තිබුණි.

- ❖ ගිවිසුම් කොන්දේසි අංක 5.2.5 ට පටහැනිව සභා අවසරයකින් තොරව කඩ බදුගත් පුද්ගලයන් පස්දෙනෙකු කඩබදු අයිතිය වෙනත් පුද්ගලයන්ට සභාවට ගෙවූ එක්වන් මුදලට වඩා වැඩි අගයකට විකුණා තිබුණද ඒ පිළිබඳව නීතිමය පියවර ගෙන නොතිබුණි.

(viii) රු.108,204,397 ක වියදමින් ඉදිකල බස්නැවතුම් පොල වෙළඳ සංකීර්ණය සඳහා වැයවූ මුදලින් රු.87,645,561 ක මුදල ආපසු ගෙවිය යුතු ණය මුදලක් වූ හෙයින් රු.6,324,000 ක ණය වාරිකයද, නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව වැය කිරීමට සිදුව ඇති රු. 3,203,124 ක වියදමට සාපේක්ෂව වාර්ෂිකව අයවන රු.3,441,000 කුලී ආදායම සමඟ සැසඳීමේදී මෙම වෙළඳ සංකීර්ණය සභාවට වැයබරක් වී තිබුණි.

(ආ) මහජන පොල වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ කඩකාමර බදුදීම.

පදික වෙළඳුන් සඳහා පැරණි මහජන පොල භූමියේ වෙළඳ සංකර්ණයේ ඉහල මාලයේ කඩ කාමර 194 කින් එක්වන් මුදල් හා කඩකාමර කුලී අයවීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) මෙම කඩ කාමර බදුදීමේදී එක්වන් මුදල් අයකිරීම කඩකුලී අයකිරීම පිළිබඳව 1996 වර්ෂයේ සිට විවිධ තීරණ ගෙන තිබුණද ඒවා ක්‍රියාත්මක වී නොතිබූ අතර 2006 අගෝස්තු 31 දිනැති අංක 7/1 දරන ස්ථාවර කමිටු තීරණයෙන් ඉහත සියළුම කඩකාමරවලින් රුපියල් ලක්ෂ 35 ක එක්වන් මුදලක්ද කඩකාමරයක මාසික කඩ කුලිය ලෙසට රු.2,000 ක්ද, එක් කඩ හිමියෙකුගෙන් රු.35,000 ක ආපසු නොගෙවන තැන්පතුවක්ද ලබා ගැනීමට තීරණය කලද එපරිදි බදු මුදල් අයවී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) ආදායම් ලේඛණ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට කඩකාමර 68 කින් රු.1,330,000 ක එක්වන් මුදල් අයවී නොතිබූ අතර ගිවිසුම් කොන්දේසි ප්‍රකාර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2011 අප්‍රේල් 29 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විට කඩකාමර 83 ක් ව්‍යාපාර කටයුතු නතරකර වසා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඒවායේ හිඟහිටි මුදල රු.2,672,921 ක් විය. තවද ව්‍යාපාර කටයුතු කරමින් තිබූ කඩකාමර 33 කින් රු.1,587,589 ක කඩබදු හිඟහිට තිබුණි.

(iv) ඉහල මාලයේ කඩකාමර හයකට එක්වන් මුදල් ගෙවා තිබූ පුද්ගලයන් වෙත එම කඩකාමර සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් භාරදී නොතිබූ අතර ඒ හේතුවෙන් එම කඩකාමර වලින් කඩ කුලී අයකර ගැනීමටද නොහැකිවී තිබුණි.

(v) මහජන පොල වෙළඳ සංකීර්ණයේ පහල මාලයේ කඩ කාමර 36 න් 12 ක් කිසිදු ව්‍යාපාරික කටයුත්තක නොයෙදී වසා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඒවායින් රු.806,190 ක් හිඟහිට තිබුණි.

(vi) විගණනය වෙත සපයන ලද තොරතුරු අනුව පහල මාලයේ කඩ කාමර 36 න් රු.6,692,795 ක එක්වන් මුදල් අයවිය යුතු වුවද ඒ සඳහා ආදායම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණෙන් එකී මුදල අයවූයේද හිඟ මුදලක් තිබේද යන්න තහවුරු නොවීය.

*(ඈ) කොටුවේගොඩ කඩ කාමර 26*

(i) 1995 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබූ මෙම කඩ කාමර 26 න සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,436,815 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර ගිවිසුම් ප්‍රකාර තක්සේරු කුලිය වසර 05 කට වරක් සංශෝධනය වී නොතිබුණි. තවද හිඟ හිටි කුලී අයකර ගැනීමට නීතිමය කටයුතු සිදුවී තිබුණේ කඩ කාමර 08 ක් සඳහා පමණි.

(ii) කඩබදු ගිවිසුමට පටහැනිව කඩකාමර 05 ක් කිසිදු ව්‍යාපාර කටයුත්තක නොයෙදී වසා දමා තිබූ අතර කඩකාමර 08 ක් ගබඩා ලෙස පරිහරණය කරමින් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම කඩකාමරවලින් පිළිවෙලින් රු.135,607 ක් හා රු.174,314 ක මුදලක් හිඟහිට තිබුණි.

(iii) ගිවිසුම් කොන්දේසි පරිදි රු.50,000 ක එක්වන් මුදල හා මාසතනක බදු මුදල මෙන් තුන් ගුණයකට සමාන මුදලක් ඇප තැන්පත් ලැබී තිබේද, මාසික කුලිය නියමිත පරිදි ලැබී තිබේද යන්න තහවුරු කර ගැනීමට විධිමත් ආදායම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

(ඇ) ගඟබඩ සාප්පු සංකීර්ණය කඩකාමර 09

(i) මෙම කඩ කාමර ඉදිකිරීම සඳහා රු.1,586,010 ක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟකුලී රු.295,009 ක්ද අංක 05 කඩ කාමරයෙන් රු.100,000 ක එක්වන් මුදලක්ද, හිඟහිට තිබූ අතර ගිවිසුම් කොන්දේසි අංක 11 පරිදි හිඟ හිටි මුදල් අයකර ගැනීමට නීතිමය පියවරද ගෙන නොතිබුණ.

(ii) මෙම කඩ කාමර වලින් රු.144,259 ක මුදලක් හිඟ හිට තිබූ කඩකාමර 05 ක් කිසිදු ව්‍යාපාරික කටයුත්තක නොයෙදී වසාදමා තිබූ හෙයින් සභාව වැයකල මුදල මහජන යහපතෙහි නොයෙදී ඇති බවත් නිරීක්ෂණය විය.

(ඉ) වෙනත් බදු කුලී

සමාලෝචිත වර්ෂය අවසානයට කොටුවේගොඩ ළමා උද්‍යානය කඩකාමර 45 කින් වර්ෂ හතරක කාල පරිච්ඡේදයක් තුල රු.5,529,705 ක්ද, වල්ගම පොල කඩකාමර 14 කින් රු.101,080 ක්ද, මාළු කඩ අල්ලි 06 කින් හා වෙනත් කඩඅල්ලි 21 කින් පිළිවෙලින් රු.14,824 ක් හා රු.137,471 ක මුදලක් හිඟහිට තිබුණි. තවද බතුතා පොල කඩ කාමර සංඛ්‍යාව, අයවිය යුතු හිඟ මුදල හා බදු කුලී අයවන ආදායම් ලේඛණය යනාදී විස්තර සභාව සතු නොවීය.

2.2.6 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.288,641 දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු22,745,203 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.8 වෙළඳ බලපත්‍ර ගාස්තු හා ප්‍රචාරක දැන්වීම්, පුවරු ගාස්තු

සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලට අදාල හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු හා හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පිළිවෙලින් රු.887,212 ක් හා රු.1,763,472 ක් අයකර ගැනමට නඩු පවරා තිබුණද එම නඩු සම්බන්ධයෙන් වරෙන්තු නිකුත් කිරීම හැර වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 141.852 | 112.418 | 29.434 | 136.391 | 108.141 | 28.250 |
| අනෙකුත් | 72.588 | 48.890 | 23.698 | 88.191 | 49.918 | 38.273 |
| උප එකතුව | 214.440 | 161.308 | 53.132 | 224.582 | 158.059 | 66.523 |
| ප්‍රාග්ධන වියදම | 15.183 | 30.792 | (15.609) | 85.057 | 46.800 | 38.257 |
| මුළු එකතුව | 229.623 | 192.100 | 37.523 | 309.639 | 204.859 | 104.780 |

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය හි දැක්වෙන විෂයයන් තථ්‍ය අය සහ වැය විෂයයන් සමඟ සසඳා ඉන් නිරීක්ෂණය වන විචලනයන් සඳහා හේතු දැක්වෙන වාර්ෂික ප්‍රකාශනයක් සකස් කර නොතිබුණි.

(ආ) වාර්ෂික අයවැය ලේඛණයේ ඉලක්කගත වියදම් සඳහා වූ ප්‍රතිපාදිත මුදල් එකී කාර්යයන් සඳහා යෙදවීමකින් තොරව පරිපූරක අයවැය ඇස්තමේන්තු 13 කින් රු.8,720,041 ක මුදලක් වැය ශීර්ෂ අතර මුදල් මාරු කරගෙන තිබුණෙන් අයවැය ලේඛණය සඵල පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොමැති බවද නිරීක්ෂණය විය.

*2.4 මානව සම්පත් කළමනාකරණය*

*2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව*

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක | 04 | 04 |
| ද්විතියික | 120 | 62 |
| ප්‍රාථමික | 253 | 249 |
| වෙනත් (අනියම්,ආදේශක, ඇස්තමේන්තුගත, කොන්ත්‍රාත්) | - | 197 |
| එකතුව | 377 | 512 |

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් සඳහා වූ වියදම රු.112,418,154 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ ඉන් රු.75,084,000 ක් පමණක් හෙයින් රු.37,334,154 ක වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතන වල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයන් 197 දෙනෙක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සහා අරමුදලින් රු.34,572,657 ක මුදලක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය

අවසානයට සහා කම්කරුවන් 90 දෙනෙකුගෙන් අයකරගත යුතු රු.1,367,229 ක වැටුප් රහිත නිවාඩු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

සභාවේ මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම් ගතකර ඇති ගිනි නිවන ඒකකයට අයත් රු.39,000,000 ක් වටිනා වාහන 05 ක් වර්ෂ 05 ක කාලපරිච්ඡේදයක් තිස්සේ ගිනි නිවන අංශයක් ආරම්භ නොකිරීම හේතුවෙන් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගිනි නිවන අංශයේ ගාල්කර තිබුණි. මෙයට අමතරව විවිධ වර්ගයේ ගිනිනිවන භාණ්ඩ හා උපකරණ 1296 ක තොගයක් කිසිදු ප්‍රයෝජනයක් නොගෙන ගිනිනිවන අංශයේ ගබඩා කර ඇති බව 2011 සැප්තැම්බර් 20 දිනැති භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

*2.5.2 ස්ථාවර වත්කම් ලේඛණය*

සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබූ අතර මාතර ප්‍රාදේශීය සභාවෙන් 2006 ඔක්තෝබර් 06 දින පවරා දෙන ලද රු.75,573,000 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි 29 ක් සභාවේ ලේඛණවලට ගෙන නොතිබුණි.

*2.5.3 ලැබිය යුතු ගිණුම්*

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 8,315,937 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 8,314,540 ක් විය.

2.5.4 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා කාලයක සිට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල එකතුව රු. 11,194,937 ක් විය. මෙම ශේෂය තුල ස්ථාන මාරු වී ගිය, විශ්‍රාමික හා සේවය අතහැර ගිය නිලධාරීන් 110 දෙනෙකුගෙන් රු.843,682 ක ශේෂයක් අයකර ගත නොහැකි වී තිබුණි.

*2.6 කොන්ත්‍රාත් පාලනය.*

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

*2.6.1 ආසියානු සංවර්ධන බැංකු ණය 1204 ශ්‍රී (SF) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ ඉදිකල* මාතර බස් නැවතුම් පොල හා වෙළඳ සංකීර්ණය.

මාතර මහා නගර සභාව ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1204 ශ්‍රී (SF) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 96.4 ක පිරිවැයකට මාතර බස්නැවතුම් පොල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 1995 ජනවාරි 03 දින හා 1997 අගෝස්තු 28 දින අතිරේක ගිවිසුමක්ද අත්සන්කර තිබූ අතර නාගරික සංවර්ධන අධිකාරිය වැයකල වියදම රු.108,204,397 ක් විය. මෙම වියදමින් රු.49,774,022 ක් ණයක් ලෙසටද රු.37,871,539 ක මුදල කඩකාමර ටෙන්ඩර් කර ලබා ගන්නා එක්වන් මුදලින්ද එකතුව රු.87,645,561 ක් ගෙවිය යුතු බවත් ඉතිරිය රු.20,558,836 පිළිබඳව ගැටළුවක් නොමැති බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2001 මැයි 03 දිනැති ලිපියෙන් දන්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) ණය ගිවිසුම් කොන්දේසි අංක 05 පරිදි ඉදිකිරීම් පිරිවැයෙන් ආපසු ගෙවිය යුතු 61.7% ක ප්‍රමාණය රු.66,762,112 ක් වුවද ගෙවිය යුතු ණය මුදල රු.87,645,561 ක් ලෙසට ගණනය කර තිබීමෙන් රු.20,883,449 ක වෙනසට හේතු අනාවරණය නොවීය.

(ii) ණය අයකර ගැනීමට ගණනය කල කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.108,204,397 ක් වුවද බිල්පත්‍රය අනුව කල වැඩ වටිනාකම රු.107,662,426 ක් වූයෙන් වෙනස රු.541,970 ක් විය.

(iii) ගිවිසුම් කොන්දේසි අංක 05 ප්‍රකාර ණය ආපසු ගෙවීමේ ඇමුණුම 02 හි දැක්වෙන උපලේඛණය අනුව පොලී හා වාරික ලෙසට (1999 ජුනි සිට 2018) වසර 20 කදී රු.126,480,000 ක් ගෙවිය යුතු බව දක්වා ඇතත් රු.49,774,022 ක ණය මුදල පියවිය යුතු ආකාරය දැක්වෙන උපලේඛණය අනුව (2000 සිට 2021) වසර 21 කදී වාරික හා පොලී ලෙසට රු.123,535,850 ක් දක්වා තිබුණෙන් වෙනස රු.2,944,150 ක් විය.

(iv) ගිවිසුම් කොන්දේසි අංක 04 ප්‍රකාර වෙළඳ සංකීර්ණය කඩ කාමර විකිණීමෙන් ලැබෙන එක්වන් මුදල (Key money) ජාතික තලයේ බැංකුවක තැන්පත් කල යුතු වුවද එය ප්‍රාදේශීය බැංකුවක් වූ රුහුණු සංවර්ධන බැංකුවේ අංක 14600 ගිණුමේ තැන්පත් කර තිබුණි. මෙම ක්‍රියාවලිය මහා නගර සභා ආඥා

පනතේ 185 හා 186 වගන්ති වලට පටහැනි වීමක් වන අතර ගිවිසුම ප්‍රකාර ගිණුම මෙහෙයවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය නිලධාරියෙකු පත්කර නොතිබුණි.

(v) සභාවේ 2001 මාර්තු 28 දිනැති සභා තීරණය හා 2001 අප්‍රේල් 02 දිනැති සභාපතිවරයාගේ ලිපියට පටහැනිව හා නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසරයකින් තොරව අංක 14600 දරන ගිණුමේ මුදල්, ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම ගිවිසුමේ අංක 9.03 කොන්දේසිය කඩ කිරීමක් ලෙසට දක්වා තිබුණද එකී තීරණවලට පටහැනිව ඉහත බැංකුවේ ස්ථාවර තැන්පත් 13 ක රු.21,530,000 ක මුදලක් ආයෝජනය කර තිබුණි.

(vi) 1997 අගෝස්තු 28 දින අත්සන් කළ ගිවිසුමේ කොන්දේසි අංක 04 පරිදි වාණිජ සංකීර්ණයේ කඩ කාමර විකිණීමෙන් ලත් මුදල් ණය මුදල් පියවීමට පමණක් යෙදවිය යුතු බව දක්වා ඇතත් එකී නියමයට පටහැනිව 2007 වර්ෂයේදී රු.5,625,000 කට නගරාධිපතිවරයාට වාහනයක්ද, රු.9,500,000 කට වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ස්ථාවර තැන්පත් 05 ක් ඇපයට තබා ණය ලබාගෙන තිබූ අතර සභාවේ පොදු ගිණුම අයත් අංක 1660083158 ගිණුමේ අයිරාව පියවීම සඳහා රු.2,000,000 ක්ද ලබාගෙන තිබුණි.

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන ණය සඳහා රු.3,861,464 ක්ද, වෙළඳ සංකීර්ණය සඳහා රු.7,770,521 ක ණය වාරික ගෙවීමට ඉතිරිව තිබූ අතර ණය ගිවිසුම් ප්‍රකාර ණය නොගෙවීම මත ඇපයට තැබූ ස්ථාවර තැන්පත් බැංකු සතුවීමේ අවදානමක්ද පැවතිණි.

2.6.2 මහජන පොල වෙළඳ සංකීර්ණයේ පළමු මහල කඩ කාමර ඉදිකිරීම

පදික වෙළදුන් සඳහා පැරණි මහජන පොල භූමියේ පිහිටි වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ කඩකාමර ඉදිකිරීම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ 2007 අප්‍රේල් 18 දින රු.7,350,093 ක ගිවිසුමක් අත්සන් කර රු.6,412,472 ක් ගෙවා තිබූ අතර ඉදිකල කඩකාමර 104 බදුදීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) 2007 පෙබරවාරි 15 දිනැති අංක 74 දරණ ස්ථාවර කාරක සභාවෙන් හා 2007 මාර්තු 08 දිනැති මහා සභාවෙන් මෙම ගොඩනැගිලි තැනීම සඳහා රුහුණු සංවර්ධන බැංකුවෙන් රු.7,500,000 ක ණය මුදලක් අනුමත වී තිබුණද ණය ගිවිසුම අනුව ණය මුදල රු.9,500,000 ක් වී තිබුණි. ඒ අනුව අවස්ථා දෙකකදී රු.6,500,000 ක් ලැබී තිබුණි. එහෙත් බැංකු කළමනාකරුගේ 2011 මාර්තු 03 දිනැති ලිපිය පරිදි ණය මුදල රු.9,500,000 ක් බවත් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.7,770,521 ක් ලෙසට දක්වා තිබුණෙන් ලබාදුන් ණය මුදල රු.3,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) ණයගිවිසුම් කොන්දේසි අංක 01 පරිදි වාරික 60 කින් සභාවට ගෙවීමට සිදුවන මුදල රු.12,751,462 ක් වූ අතර ඉදිකල කඩ කාමර 194 පිළිබඳව 2011 අප්‍රේල් 29 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වනවිටත් කඩකාමර වලින් 80% හෙවත් කඩකාමර 83 ක් කිසිදු ව්‍යාපාරික කටයුත්තක නොයෙදී වසාදමා තිබීමෙන් සභා අරමුදල් මහජන යහපතෙහි නොයෙදී ඇති බව නිරීක්ෂණය විය.

(iii) රු.6,412,472 ක් වැයකර ඉදිකල මෙම වෙළඳ සංකීර්ණයේ වැසිකිළි හා වෙනත් සනීපාරක්ෂක පහසුකම් සැපයීමට සැලසුම් කර නොතිබුණෙන් සාප්පු සංකීර්ණයේ වෙළදුන් හා පාරිභෝගික ජනතාව මහත් අපහසුතාවයන්ට මුහුණ දී ඇති බවද ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2.6.3 මහා නගර සභා සීමාව තුල මාර්ගවල කාණු පවිත්‍ර කිරීම

සභා බල ප්‍රදේශයේ මාර්ගවල කාණු පවිත්‍ර කිරීම සඳහා 2009 සහ 2010 වර්ෂ තුල රු.7,081,307 ක වැටුප් ගෙවීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මෙසේය.

(i) සභා බල ප්‍රදේශයේ නඩත්තු කරනු ලබන කාණුව අයත් මාර්ගය කාණුවේ දිග, පළල, කාණුව ආරම්භ වන හා අවසන් වන ස්ථාන වල වර්පනම් අංක හෝ වෙනත් හඳුනා ගැනීමේ සංකේත යනාදී විස්තර සභාව සතු නොවීය.

(ii) එක් එක් කාණුව පවිත්‍ර කිරීම සඳහා සකස් කල ඇස්තමේන්තුව, යෙදවූ කම්කරුවන් ගණන, දෛනික වැඩ බෙදා හැරීමේ පිටපත් නොතිබූ අතර ඒ ඒ වර්ෂවල පවිත්‍ර කල කාණු ගණන පිළිබඳ විස්තර නොවීය.

(iii) කසල හා කාණු පවිත්‍ර කිරීමට කම්කරුවන් යොදවන සංඛ්‍යාව පිළිබඳ නිශ්චිතව හඳුනාගෙන පිළියෙල කල ඇස්තමේන්තු මුදල් කාරක සභාව අනුමත කර තිබූ අතර එසේ අනුමත කල ප්‍රමාණයට වඩා 2009 වර්ෂයේදී රු.107,660 ක්ද 2010 වර්ෂයේදී රු.53,079 ක්ද වැඩිපුර ගෙවා තිබුණි.

2.7 ඒෂියා අර්බ්ස් ව්‍යාපෘතිය (Asia Urbs)

සභා බල ප්‍රදේශයේ භූගෝලීය තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ අරමුණු ඇතිව, මොරටුව විශ්ව විද්‍යාලය, ජාත්‍යන්තර විශ්ව විද්‍යාල හා විදේශ මහ නගර සභා කීපයක් සමඟ සම්බන්ධවී යුරෝපා සංගමයේ බෙල්ජියම් කතෝලික

යුනිවර් සිටි ලියුවන් ආයතනය සම්බන්ධ වී තිබූ අතර ඒ සඳහා යුරෝ 27,482 ක් හෙවත් රු.3,380,286 ක හා රු.918,197 ක සභා දායකත්වයකින් යුක්ත වියදම් ඉලක්කයකින් යුක්ත විය. මෙම ව්‍යාපෘතිය සඳහා 2006 හා 2007 වර්ෂ තුල ඒෂියා අර්බිස් ආයතනය හා සභා දායකත්වය පිළිවෙලින් රු.2,520,337 ක් හා රු.446,785 ක් වශයෙන් එකතුව රු.2,967,122 ක මුදලක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මු.රෙ.610 පරිදි විදේශාධාර සඳහා වන සියළුම සාකච්ඡා පවත්වනු ලැබිය යුත්තේ භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බවත් කවර හෝ ව්‍යාපෘතියක් හෝ කාර්යයක් සඳහා විදේශාධාර ලබාගත හැකිද යන්න පිළිබඳව සියළු විමසීම් කලයුත්තේද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් වුවද මෙම ව්‍යාපෘතිය සඳහා එකී නියමය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) මෙම ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා 2005 ජුලි 29 දිනැතිව ආරම්භ කර තිබූ අංක 1989588 දරණ ලංකා බැංකු ගිණුමේ 2005 වර්ෂයේ සිට 2007 ජුනි 29 දින දක්වා කාල පරිච්ඡේදය තුල රු.3,472,101 ක ලැබීම් (යුරෝ 27481.46) හා රු.2,967,122 ක ගෙවීම් වලට අදාලව මු.රෙ.185 ප්‍රකාර මුදල් පොතක් හා ගෙවීම් වවුචර් පිළියෙල කිරීමත් මු.රෙ. 395 ප්‍රකාර බැංකු සැසදුම් පිළියෙල කිරීමත් සිදුව නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 185 හා 186 වගන්ති පරිදි සභාවට ලැබෙන සියළු ලැබීම් සභා අරමුදලට බැරකර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන වලද දක්වා නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයූ ආයතනය සමඟ ගිවිසුම්ගත බැඳීමක් අත්සන් කර නොතිබුණි. කාර්තු වාර්තා හා වියදම් වාර්තා යැවීම සිදුව නොතිබූ අතර 2007 ජුනි 30 දිනට ඉතිරිව තිබූ රු.952,265 ක මුදල අරමුදල් සැපයූ ආයතනය වෙත ආපසු ප්‍රේෂණය නොකොට සභාවේ සංවර්ධන ගිණුමට බැරකරගෙන තිබුණි.

(ඉ) මෙම ව්‍යාපෘතිය යටතේ සභාවේ කටයුතු කරන නිලධාරීන් 04 දෙනෙකු වෙත විදේශ සංචාරයන් සඳහා (යුරෝ 3,300 ක) රු.415,260 ක උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපාදනය කර තිබුණද, ඉන්දියාවේ මුම්බායි නගරයේ ක්ෂේත්‍ර පරීක්ෂාවකට යාම සඳහා රු.485,499 ක්ද, පකිස්ථානයේ කරච්චි නුවර සංචාරයක් සඳහා රු.566,580 ක්ද වශයෙන් එකතුව රු.1,052,079 ක් වැයකර තිබුණි.

(ඊ) ව්‍යාපෘතිය සඳහා රු.265,700 කට මිලදී ගත් පරිඝනකය, ස්කෑන් යන්ත්‍රය, හා මුද්‍රණ යන්ත්‍රය ව්‍යාපෘති කාර්යන්හි නොයොදා අකර්මන්‍යව තිබූ අතර රු.703,782 ක් වැයකර මිලදී ගත් භූගෝලීය තොරතුරු පද්ධතිය (Preparation GIS data base) ප්‍රයෝජනයට ගැනීම 2011 ජුලි 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

(උ) මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කල පහත සඳහන් අරමුණු 2011 ජුලි 31 දින වන විටද ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී ඇති බැවින් මූල්‍යාධාර හා සභා අරමුදලින් වැයකල රු.2,967,122 ක වියදම ඵලරහිත වී තිබුණි.

- ❖ මහා නගර සභා බල ප්‍රදේශය දැක්වෙන සිතියමක් (Base map) සකස් කර නොතිබීම.
- ❖ භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතා කල හැකි පරිගණකයක් මිලදී නොගැනීම.
- ❖ භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය පිළිබඳව වගකිව යුතු නිලධාරීන් දැනුවත් කිරීම් නොකිරීම.
- ❖ සංඥා ප්‍රකාශක සිතියම් පිළිබඳව (Sensitive maps) දැනුවත් කිරීම් සිදු නොවීම.

2.8 ගොඩනැගිලි අයදුම්පත්‍ර සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම

1984 අංක 44 හා 1982 අංක 4 දරන පණතින් සංශෝධිත 1976 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 (ඒ) වගන්තිය ප්‍රකාර 2009 සහ 2010 වර්ෂයන්හි ගොඩනැගිලි අයදුම්පත් 836 ක් ලැබී තිබූ අතර එම ගොඩනැගිලි සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේදී නියැදියක් ලෙසට තොරාගත් තෙමහල් ගොඩනැගිලි 37 ක් සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු මෙසේය.

(අ) නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 17 හා 1597/8 දරණ ගැසට් පත්‍රයේ V වන උප ලේඛණයේ 1:II පරිදි ගොඩනැගිලි අයදුම්පත් 07 කින් රු.20,308 ක පෙරසැරි ගාස්තු අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ආ) ඉහත ගැසට් පත්‍රයේ 6(vii) ඡේදය පරිදි අනුකූලතා සහතික නොමැතිව පදිංචිව/භාවිතා කිරීම සඳහා දිනකට රු.50 බැගින් ගාස්තු අයකල යුතු වුවද එසේ නොවූ අවස්ථා 04 කින් රු.58,800 ක් අයකර නොතිබුණි.

(ඇ) ඉහත ගැසට් පත්‍රයේ 6(ii) ඡේදය පරිදි නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකල ගොඩනැගිලි සඳහා ආවරණ අනුමැතිය දීමේදී අයකල යුතු ගාස්තු අඩුවෙන් අයකර තිබූ හා සම්පූර්ණ මුදලම අයකර ගෙන නොතිබූ අවස්ථා 05 කින් රු.5,614,670 ක් අයවීමට තිබුණි.

(ඈ) ඉහත ගැසට් පත්‍රයේ 5 ඡේදයේ පරිදි මෝටර් රථ නවතා තැබීමේ ස්ථාන, නාගරික සංවර්ධන අධිකාරී නියෝග යටතේ සැලැස්මේ පෙන්විය යුතු බවට නියමකර ඇති නමුත් එසේ සපයා නැති එක් මෝටර්

රථයක් සඳහා අයකලයුතු සේවා ගාස්තු නියමකර තිබුණි. ගොඩනැගිලි සැලැස්මේ වාහන නැවතුම් ස්ථාන පෙන්වා තිබුණද 2011 අගෝස්තු 05 දිනැති භෞතික පරීක්ෂාවේදී එසේ වාහන නැවතුම් ස්ථාන දක්නට නොතිබූ අතර එවැනි අවස්ථා 05 කින් රු.10,500,000 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඉ) BA/245/2009 දරණ සැලැස්ම සඳහා නේවාසික ගොඩනැගිල්ලක් ලෙසට අනුමැතිය දී තිබුණද 2011 අගෝස්තු 05 දිනැති ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විට ගොඩනැගිල්ලේ හෝටල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර ඉහත ගැසට් පත්‍රයේ 7(ii) ඡේදය ප්‍රකාර ගොඩනැගිලි භාවිතය වෙනස්කිරීම වෙනුවෙන් අයකර ගත යුතු රු.631,100 ගාස්තු මුදල අයකර ගෙන නොතිබුණි. තවද නාගරික සංවර්ධන අධිකාරියේ 1986 අගෝස්තු 29 දිනැති අංක 04 සැලසුම් චක්‍රලේඛය පරිදි සභා බල ප්‍රදේශයේ ගොඩනැගිලි භාවිතය වෙනස්වීම පිළබඳ සමීක්ෂණද සිදුකර නොතිබුණි.

2.9 වාහන පාලනය

සභාවේ ප්‍රවාහන ඇණියට අයත් වාහන 08 ක් ගර්හිත කර ධාවනයෙන් ඉවත්කර ඇතත් සමාලෝචිත වර්ෂයේ එකී වාහන සඳහා ආදායම් බලපත්‍ර හා රක්ෂණය කිරීම සඳහා පිළිවෙලින් රු.5,925 ක් හා රු.38,778 ක් වැයකර තිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) හිණුම්කරණය.
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය.
(ඉ) සේවක ණය පාලනය.
(ඊ) වාහන පාලනය